# විපර්යකාරක කුඩා කණ්ඩායම් තුළින් පුද්ගලයන්ට සපයන සේවාවේ ගුණාත්වය (ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

එම්. ජී. පී. එස් මධුමාලි*, ආර්. එම්. කේ. ජී. යූ. රත්නායක
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
*piyumimadushanika@gmail.com

ග්‍රාම සංවර්ධනය වෙත අතීතයේ සිට අවධානය යොමු වූ අතර, රජය සහ රාජ්‍ය නොවන සංවිධාන එක් වැඩසටහනක් අසාර්ථක වන විගසින්, පරිපාලන ක්‍රමවේදය වෙනස්වන පමණින් නවමු ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති දියත් කරන ලදී. එහෙත් අපේක්ෂිත අන්දමට සංවර්ධනය ගම තුළින් දැකිය නොහැකි විය. සමාජ සවිබල ගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය කේන්ද්‍ර කොට පිහිටුවා ඇති ග්‍රාම සංවර්ධන හා පුහුණු පර්යේෂණ ආයතනය විසින් දියත් කරන විපර්යකාරක කුඩා කණ්ඩායම් ක්‍රමය ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතීන්ගේ දුර්වලතාවන් ගවේෂණය කර සාර්ථකව පුද්ගලයින් සවිබලගැන්වීම උදෙසා විධික්‍රම තනයි. සංවර්ධන වැඩසටහන්වලින් නොසලකා හැර තිබුණු ආර්ථික හා සමාජීය වශයෙන් පීඩාවට පත් වූ ප්‍රජාව සතු නිර්මාණශීලී කුසලතාවන් ඉස්මතු කරගනිමින් ඔවුන් සංවර්ධනයේ කේන්ද්‍රය බවට පත්කරගැනිම මෙම ප්‍රවේශයේ මූලික හරයයි. පුද්ගලයන් මෙම විපර්යකාරක වැඩසටහන කෙරෙහි නැඹුරුවීමට බලපාන විවිධ සාධක අතර මෙම සේවාවෙන් ලැබෙන සේවා ගුණාත්වය කේන්ද්‍රීය ලාක්ෂණිකයක් ලෙස හඳුනා ගන්නා ලදී. නමුත් විපර්යකාරක වැඩසටහන පිළිබඳව විවිධ විශ්ලේෂකයන් විසින් පර්යේෂණ සිදු කර ඇතත් සේවා ගුණාත්වය පූර්ණ වශයෙන් පර්යේෂණයට යොමු වී නොමැත. එබැවින්, විපර්යකාරක වැඩසටහන කෙරෙහි පුද්ගලයන් නැඹුරු වීමට එහි සේවා ගුණාත්වය බලපාන්නේද යන්න හඳුනා ගැනීම සඳහා මෙම විපර්යකාරක වැඩසටහන තුළින් ලැබෙන සේවාවේ ගුණාත්ව මට්ටමත්, සේවාවේ ගුණාත්වය හා සේවා ගුණාත්ව සාධකථ භෞතිකත්වය, විශ්වාසනීයත්වය, ප්‍රතිචාරාත්මක බව, ආරක්ෂාව, සංවේදනය අතර සම්බන්ධයත් හඳුනාගැනීම මෙම අධ්‍යයනයෙන් ප්‍රධාන වශයෙන් අපේක්ෂා කෙරේ. සසම්භාවීව පොකුරු නියදීම් ක්‍රමය යටතේ ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ග්‍රාම සේවා වසම් දහයක් තෝරා ගෙන සාමාජිකයන් සමානුපාතික නියෝජනය වන පරිදි ඉබ්බාගමුව ප්‍රජා ශක්ති සංවිධානයේ සාමාජික ලැයිස්තුවෙන් සරල සසම්භාවීව පුද්ගලයන් 387ක නියදියක් තෝරා ප්‍රශ්නාවලී ක්‍රමය යටතේ දත්ත රැස් කර ගන්නා ලදී. සරල දර්ශකාංකයන් සහ තනි නියදි එ පරීක්ෂාවට අදාළව ලද ප්‍රතිඵල ඇසුරින් මෙම කුඩා කණ්ඩායම් සාමාජිකයන්ට ලැබෙන සේවා ගුණාත්වය ඉහළම මට්ටමේ පවතින බව තහවුරු විය. එසේම විපර්යකාරක කුඩා කණ්ඩායම්හි සේවා ගුණාත්ව මට්ටම සහ ගුණාත්ව සාධක අතර පවතින වෙසෙසියාත්මක සම්බන්ධතාවය හඳුනා ගැනීමට සිදු කළ ස්වායක්තතාවය පිළිබඳ කයි වර්ග පරීක්ෂාවේ ප්‍රතිඵලවලට අනුව භෞතිකත්වය හැර සෙසු සාධක එනම්, විශ්වසනීයත්වය, ප්‍රතිචාරාත්මක බව, ආරක්ෂාව, සංවේදනය අතර සංඛ්‍යාත්මක සම්බන්ධතාවයක් පවතින බව තහවුරු කර ගන්නා ලදී ($P<0.05$). එබැවින්, පුද්ගලයන් විපර්යකාරක වැඩසටහනට නැඹුරු වීමට මෙම කුඩා කණ්ඩායම් ක්‍රමය තුළින් ලැබෙන සේවා ගුණාත්වය වෙසෙසියාත්මක සම්බන්ධතාවක් දක්වන සාධකයක් බව තහවුරු වූ බැවින් ස්වයං රැකියා වැඩමුළු ආදිය ක්‍රියාත්මක කරමින් ගුණාත්මක බව ඉහළ මට්ටමක පවත්වාගෙන යාමට කටයුතු කරන්නේ නම් මෙම කුඩා කණ්ඩායම් කෙරෙහි තවදුරටත් පුද්ගලයන් ආකර්ෂණය කර ගැනීමට ඉහළ හැකියාවක් පවතී.

**මුඛ්‍ය පද** : ගුණාත්ව සාධක, ග්‍රාම සංවර්ධනය, සේවා ගුණාත්වය, විපර්යකාරක කුඩා කණ්ඩායම